පුද්ගලයකු වියදම් කරන විශිෂ්ටතම දීනාරය නම්, තම පවුලේ අය වෙනුවෙන් වියදම් කරන දීනාරය, අල්ලාහ්ගේ මාර්ගයේ සිටින තම ප්රවාහනික සත්වයා වෙනුවෙන් මිනිසා වියදම් කරන දීනාරය හා අල්ලාහ්ගේ මාර්ගයේ සිටින තම සගයින් වෙනුවෙන් වියදම් කරන දීනාරයයි

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව සව්බාන්
(රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී: "පුද්ගලයකු වියදම් කරන විශිෂ්ටතම දීනාරය නම්, තම පවුලේ අය වෙනුවෙන් වියදම් කරන දීනාරය, අල්ලාහ්ගේ මාර්ගයේ සිටින තම ප්රවාහනික සත්වයා වෙනුවෙන් මිනිසා වියදම් කරන දීනාරය හා අල්ලාහ්ගේ මාර්ගයේ සිටින තම සගයින් වෙනුවෙන් වියදම් කරන දීනාරයයි" යැයි පැවසූහ. අබූ කිලාබා තුමා: "හෙතෙම තම පවුලෙන් ආරම්භ කර ඇති" බව පැවසීය. තවදුරටත් අබූ කිලාබා තුමා මෙසේ පැවසීය: ‘තම කුඩා
පවුල වෙනුවෙන් වියදම් කරන මිනිසාට හිමි ප්රතිඵලයට වඩා උතුම් වනුයේ වෙනත් කවර මිනිසෙකුගේ ප්රතිඵල ද? අල්ලාහ් ඔහු තුළින් ඔවුන්ට පෝෂණය ලබා දී, ඔවුනට සෙත සලසා දෙයි. තවද ඔවුන් පොහොසත් කරයි." [صحيح] [رواه مسلم]

වියදම් කිරීමේ ස්වරූපයන් ගැන නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් පැහැදිලි කර ඇති අතර ඒවා අධික වූ විටෙක ඔබට වඩාත් අනිවාර්යය වන පරිදි වියදම් කිරීමේ වඩාත් උචිත ආකාරය පෙළගස්වා දී ඇත. එබැවින් වඩාත් වැදගත් දැයින් ආරම්භ කර, පසුව වඩාත් වැදගත් දෑ වෙනුවෙන් වියදම් කළ යුතු වේ. ධනයෙන් වඩාත් අධික කුසල් හිමිකර දෙන වියදම නම්, තම බිරිය හා දරුවන් වැනි තමන්ගෙන් යැපෙන්නන් හට මුස්ලිම්වරයකු කරන වියදම වේ යැයි එතුමාණන් දන්වා ඇත. පසු ව අල්ලාහ්ගේ මාර්ගයේ සටන් කිරීම සඳහා සූදානම් කර තබා ඇති ප්රවාහනික සත්වයා කෙරෙහි කරන වියදමයි. පසුව අල්ලාහ්ගේ මාර්ගයේ වෑයම් කරන තම මිතුරන් හා සගයින් වන මුජාහිදීන්වරු කෙරෙහි කරන වියදමයි.

http://www.sunnah.global/hadeeth/si/show/3267